**ශ්‍රී ලංකාව තුළ විවිධ වූ සම්මාන උළෙලවල් රාශියකි. මේ සියලුම සම්මාන උළෙලවලට පොදු වූවක් ලෙස සම්මාන ප්‍රධානයෙන් පසුව සිදුවන 'මඩ ගසාග ැනීම්' ද හැඳන්විය හැක. රාජ්‍ය නාට්‍ය උළෙලකට පසු පශ්චාත් යුගය මේ අතර සුවිශේෂීය. දැන් ජාතික නාට්‍ය උළෙල ලෙස නම්කොට ඇති රාජ්‍ය නාට්‍ය උළෙල පසුගිය වසරේදී නිමාවීමටත් පෙර සිටම මෙම 'මඩ යුද්ධය' ආරම්භ වී තිබිණි. එය නැවතුණේ ද සුනාමි ඛේදවාචකය නිසාය. සුනාමි ඛේදවාචකයට තුන්මසක් ගතවීමටත් පෙර සිටම මේ වසරේ ජාතික නාට්‍ය උළෙල ආරම්භ විය. දැන් එය ද අවසන් වී දින කිහිපයකි. එහෙත් තවමත් මෙවර නාට්‍ය උලෙල සම්බන්ධයෙන් බරපතල මඩගසාගැනීම් නම් සිදුව නැත. මේ මෙවර නාට්‍ය උත්සවය ගැන කතාවයි.**

# ලංකාවට අලුත් නාට්‍ය සංස්කෘතියක්

ලෝක නාට්‍යකරුවන්ගේ දිනය ලෙස සළකනුයේ මාර්තු මස 28 වැනි දිනයයි. මේ දිනය සහ එම කාල වකවානුවේ ලොව බොහෝ රටවල නාට්‍ය පිළිබඳ වූ විවිධාකාර කටයුතු සිදුවන අතර මෙතෙක් කාලයකට මේ කාලයේ ශ්‍රී ලංකාවේ සිදුවූ එකම කටයුත්ත වූයේ සම්මන්ත්‍රණයක් පැවැත්වීම පමණයි. මෙම තත්වය වෙනස් කර මෙවර එම කාලයේ ජාතික නාට්‍ය උළෙල පැවැත්වීම සඳහා කළ වෙනස පිළිබඳව නාට්‍ය අනුමණ්ඩලයේ සභාපති නීතිඥ ඩග්ලස් සිරිවර්ධන මහතා මෙසේ කියයි.

'මාර්තු 28 ඇතුළු ඒ ආසන්න දිනයන්වල ලෝකයේ ඉතාමත් උත්කර්ශවත් අයුරින් නාට්‍ය උළෙල පවත්වනවා. ශ්‍රී ලංකාව තුළ නාට්‍ය සංස්කෘතියක් ගොඩනැගීමට නම් පළමුවෙන්ම නාට්‍ය පිළිබඳව වූ කතිකාවතක් ඇතිවිය යුතුයි. අපි සම්මාන ප්‍රධානය යොදාගත්තේ 27 වෙනිදාට . එතෙක් දෙවන වටය සහ අවසන් වටය නියෝජනය කරමින් නාට්‍ය රඟදැක්වුණා. මේ ආකාරයට තව අවුරුදු දෙකතුනක් යනවිට ලංකාව තුළත් යම් නාට්‍ය සංස්කෘතියක් බිහි කරගත හැකි වේවි'

මෙතෙක් පැවති සම්ප්‍රදායට අනුව දෙවන සහ අවසන් වටය යනුවෙන් වට දෙකක් පැවැතුණද මෙවර එම ක්‍රමය වෙනස් කරමින් අවසන් වටය පමණක් පවත්වා ඉන් සම්මාන ප්‍රධානය කිරීමට සැලසුම් කර තිබිණ. ඒ අනුව ඉකුත් 15 වෙනි දින සිට 23 වෙනි දින තෙක් නාට්‍ය 9ක් රඟදක්වනු ලැබිණි.

මින් පළමුව රඟදැක්වූයේ ආර්.ආර් සමරකෝන් මහතාගේ 'කපුටු බෝ' නාට්‍යයයි. මීට වසර 35කට පමණ පෙර ඔහු විසින්ම නිෂ්පාදනය කළ චරිත දෙකක් නාට්‍යය කපුටු බෝ ලෙස නවීකරණය කර ඇත. විවාහ ජීවිතය - බිරිඳකගේ පතිවත සහ සැමියකුගේ අනියම් සබඳතාව යන 'පැති' අලලා මෙය ගොඩනැ-ගී තිබිණි. හෂනිකා කරලියද්ද, ප්‍රසන්නජිත් අබේසූරිය, ගිහාන් ප්‍රනාන්දු වැනි නළුනිළි පිරිසක් මෙයට රංගනයෙන් දායක වී තිබිණි.

ඉනික්බිතිව රඟදැක්වූයේ සුනිල් චන්ද්‍රසිරිගේ දොන්ජුවන් නාට්‍යයයි. නිශ්ශබ්ද වනු, සමාවෙන්න වැරදීමක් ආදී පරිවර්තන නාට්‍ය නිශ්පාදනය කර නමක් දිනාගත් සුනිල් චන්ද්‍රසිරිගේ මෙම නාට්‍යය කේ.බී හේරත්ගේ රචනයකි. නව පරපුරේ දක්ෂ රංගන ශිල්පියකු වන ජගත් චමිල මෙහි ප්‍රධාන භූමිකාවට පණ ගන්වයි. 'දොන් ජුවන්' යන නාට්‍යයේ නමට යටින්(පරංගි තවමත් කෝට්ටේ යනවා) ලෙස සඳහන් කර තිබූ මෙය 'නිදහස' යන මූලික සංකල්පය පෙරදැරිකරගත් නාට්‍යයකි.

අතොල් ෆොගාඩ් වැනි ප්‍රකට දකුණු අප්‍රිකානු නාට්‍යකරුවන්ගේ නාට්‍ය ලාංකේය වේදිකාව මත නිර්මාණය කළ බුද්ධික දමයන්ත මෙවරද නාට්‍ය උළෙලට ද නාට්‍යයක් ඉදිරිපත් කර තිබිණි. 'පරණ අයගේ කතාවක්' නම් මූ මෙය සෝවියට් නාට්‍යකරු අපිලක්සි අර්බොෂෙවුගෙ නාට්‍යයක පරිවර්ථනයකි. මේ සඳහා දයාදේව එදිරිසිංහ සහ මල්කාන්ති ජයසිංහ රංගනයෙන් දායක වී සිටියහ.

**හොඳම නළුවා**
ප්‍රසන්නජිත් අබේසූරිය
**(දොන් ජුවන්)**

**හොඳම නිළිය**
ජයනි සේනානායක
**(සිහින හොරු අරන්)**

**හොඳම නාට්‍යය**
**සඳ ලඟ මරණය**
කෞශල්‍යා ප්‍රනාන්දු

**හොඳම ස්වීය නාට්‍යය**
**සිහින හොරු අරන්**
රාජිත දිසානායක



**කපුටු බෝ නාට්‍යයේ ජවනිකාවක්**

යුද්ධයෙන් බිහිවන පරිසරය සහ එම පරිසරයට දරුවන් බිහිකරන මවුවරුන් පිළිබඳව තේමා කොට ගත් 'මිටියාවතේ ගීතය' නම් නාට්‍ය අනතුරුව රඟදැක්විණි. පනහකට ආසන්න ශිල්පීන් පිරිසක් මේ සඳහා දායක වී තිබූ අතර ඒ සියලු දෙනාගේ වගකීම නාට්‍ය හා මනාව කැටිවී තිබෙනු දැකගත හැකි විය.

පුංචි තිරයේද ජනප්‍රිය සේමිණී ඉද්දමල්ගොඩ සහ උදේනි අල්විස් රංගනයෙන් දායක වූ 'මම ඉපදුණේ ඊයේ නොවෙයි' නාට්‍ය මාර්තු 14 වෙනි දින රඟ දැක්විණි. නත්තල් දිනට පෙර දින රාත්‍රියේ සුපිරි වෙළෙඳ සැළක සේවයට පැමිණි සේවකයන් දෙදෙනෙකු ස්වකීය ජීවිත යථාර්ථ මතුකරනු මින් දැකගත හැකි විය. 'ජර්මන්' නාට්‍යයක පරිවර්තනයක් වූ මෙය එම්. සෆිර්ගේ නිර්මාණයකි.

මාර්ක් කැමලොට්ගේ 'හැපි බර්ත් ඩේ' නාට්‍යය හේමන්ත ප්‍රනාන්දු විසින් 'මල්සර බිසව්' ලෙස නිර්මාණය කර තිබූ අතර එයද අවසන් වටය සඳහා රඟදැක්විණි. ප්‍රේමය හා එයට යටින් දිවෙන කුහකත්වය මින් ප්‍රකාශ වූ අතර ඒ සඳහා රංගනයෙන් හෂනිකා කරලියද්ද, උදේනි අල්විස්, හේමන්ත ප්‍රසාද් ඇතුළු රංගන ශිල්පීන් දායක විය. මෙය 'අනුර්වර්ථන' නාට්‍යයක් ලෙස ඉදිරිපත් කොට තිබිණි.

මෙවර නාට්‍ය උළෙල සඳහා වැඩිම තරුණ පිරිසක් දායක වූ නාට්‍යය ලෙස 'මේ හීනෙට නමක් දෙන්න' නාට්‍යය හැඳින්විය හැක. තරුණ රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදකයකු හදිසියේම තම රැකියාව අහිමි වීමෙන් පසු මරණය තෝරාගන්නා අයුරුත් අනතුරුව ජීවිතය තුළ ජීවත්වන මරණය තේරුම්ගන්නා අයුරුත් මින් ඉදිරිපත් විය. ප්‍රියන්ත කළුආරච්චි විසින් නිර්මාණය කර තිබූ මෙම නාට්‍යය සැබැවින්ම තරුණයන්ටත් තරුණියන්ටත් කෙරුණු නාට්‍යයක් ලෙස හැඳින්විය හැක.

තරුණ නාට්‍ය අධ්‍යක්ෂිකාවක් නාට්‍ය උළෙල සඳහා පළමු වරට අවතීරණය වූයේ ද මේ අතරය. ඈ ප්‍රවීන නාට්‍යවේදිනී සෝමලතා සුභසිංහයන්ගේ දියණිය වූ කෞෂල්‍යා ප්‍රනාන්දුය. ස්පාඤ්ඤ ජාතික නාට්‍යකරු ගර්ශියාගේ ලොර්ක්ගේ "බ්ලඩ් වෙඩින්" නාට්‍යය කෞෂල්‍යා විසින් 'සඳ ළඟ මරණය' ලෙස නිර්මාණය කර තිබිණි. කෞෂල්‍යා ප්‍රනාන්දු, චමිලා පීරිස්, ලූෂන් බුලත්සිංහල ඇතුළු නළුනිළි පිරිසක් රංගනයෙන් දායක වී ඇති මෙහි පරිවර්තනය නදී කම්මැල්වීර සහ කෞෂල්‍යා ප්‍රනාන්දු විසිනි.

වීරයා මැරිලා, මට වෙඩි තියන්නේ නැද්ද, ආදී නාට්‍ය නිර්මාණය කළ රාජිත දිසානායකගේ 'සිහින හොරු අරං' නාට්‍යය මෙවර නාට්‍ය උළෙලෙ අවසන් වටය නිමා කරමින් රඟ දැක්විණි. තමන්ට ආවේණික ශෛලිය 'සිහින හොරු අරං' තුළද රැකගත් රාජිත තම සුපුරුදු නළුනිළි කැළ වන ප්‍රසාද් සූරියආරච්චි, ගිහාන් ප්‍රනාන්දු, ජයනි සේනානායක, දයාදේව එදිරිසිංහ, ප්‍රියකර රත්නායක, ධර්මප්‍රිය ඩයස් ආදීන් ඒ සඳහා රංගනයෙන් දායක කරගෙන තිබිණි. උපතින් ලබා තිබෙන සමාජ තත්වය වෙනස් කරගැනීම ප්‍රේමය සහ බලය යොදාග න්නා මිනිසුන් පිරිසකගේ උත්සාහය නාට්‍යය තුළ විය.

මෙකී නාට්‍ය උදෙසා සම්මාන ප්‍රධානය මාර්තු 27 වන දින සිදු කරනු ලැබිණ. දමිළ නාට්‍ය උළෙලක් සහ කෙටි නාට්‍ය උළෙලක් ද මේ වසරේ ඉදිරි කාලය තුළ පැවැත්වීමට නියමිතය. දෙසැම්බර් මාසයේදී මේ සියල්ල එක්කොට නාට්‍ය මහොත්සවයක් පැවැත්වීමට නාට්‍ය අනුමණ්ඩලය සැලසුම් කර ඇත. මේ වනතුරු මඩ ප්‍රහාර එල්ල නොවූ මෙම නාට්‍ය උළෙලෙන් කෙසේ වෙතත් සංස්කෘතික හා ජාතික උරුමය පිළිබඳ අමාත්‍යාංශය ශ්‍රී ලංකාව තුළ නව නාට්‍ය සංස්කෘතියක් ඇති කිරීමට දරන උත්සාහය යම් සාර්ථක බවක් පෙන්නුම් කරන බව නම් සඳහන් කළ යුතුය.

**ළහිරු සමරසිංහ**

## අවසානය සහ ආරම්භය

මොහොතකට නවතිමි
නිවාගන්නට
දැනෙන සරතැස
ඉසිඹුවක් ඇවැසිය
විඩාපත් දෙපයට
දෙපයට වඩා
රිදෙන්නේ
සිත ය
බැලිය යුතු වුවද
ආපසු හැරී
ගමන් සගයන්
මා අතැර ගිය
දැඩි කරගත යුතුවේ ය
රිදුම් දෙන සිත
හැරී බැලුමින්
පලක් වෙද කිසි විට
අතහැරුණ අතක්
දෑතක් වෙනුවට
දිගු කෙරුණ
දහසක් අත්
නිවාලයි මසිත සරතැස
කාලාවසානය අබියස
බිහි නොමවේ ය
හිස් අවකාශයක්
බිහිවේ ය එතැන
බලාපොරොත්තුවේ
ඉදුවර පොකුණ
එතැන ය නැවත ඇරඹුම
නැගිටිමි
තබන්නට
තවත් පියවර දහසක්
ඔව්,
පියවර දහසක්

**ජගත් ජේ එදිරිසිංහ**

## කඳුලක කතාව

සහසක් පැතුමන් හිරවුණු
නීල නයන නෙතු සගලින්
වත්සුනු දියකර පාකර
අමිල ලොවක අරුණාළු පැතු
කඳුළ ද නිහඬව වැටුනේ....

ආදර මන්දිර හදලා
ඒ තුළ වල්මත් වීලා
ජීවිතයට ජීවිතයක්
සොයා ගියත් හිස් ලොව තුළ
ලැබුවේ සෙනෙහසදෝ මම
අරුත ද මිරිගුව පවසන
එයම ද කඳුළේ උපතම...

පුංචි පුතෙක් පුංචි දුවෙක්
සෙනෙහස නැහැ ඉමක් කොනක්
දැරියක් යුවතියක් ළඳක්
ජීවිතයම ගමන් මඟක්
පාළු ලොවක මම බිරිඳක්
සිහින ලොවක මම අම්මෙක්
කඳුලක් නැහැ නැති දවසක්...

වසන්තය නොදන්නෙමි
කිසිදින මා දැක නැත්තෙමි
අසා ඇතත් ඒ ලොව තුළ
සුන්දර සිතුවිලි මන්දිර
හඬන සිතට මද සිසිලක්
ලැබුණ දාට මගෙ හදටත්
තුරුළු වෙනව මුළු හදින්ම
මුහුණ හොවා ලය මඩලට
දෝතින් මගෙ සතුට බදා
හෙලනවා මම උණු කඳුලක්
ආදරයේ සෙනෙහෙ පතා...

**උදය ගෝවින්න**

